# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 4 ඒකකය - I |
|---|---|---|

## ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන (දළ ලාභය)

### I - කොටස

❖ **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 10 තෙක් දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. ව්‍යාපාරයක දළ ලාභය හෝ අලාභය ගණනය කිරීම සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනය වනුයේ,

(1). මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(2). ලාභ හෝ අලාභ ප්‍රකාශනය
(3). බැංකු සැසඳුම් ප්‍රකාශනය
(4). පොදු ජ'නලය

02. ව්‍යාපාරයක ලාභ හෝ අලාභ ප්‍රකාශය පිළියෙල කිරීම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1). ණයට විකුණුම් හා ණයට ගැණුම් පමණක් සටහන් කරයි
(2). අත්පිට විකුණුම් හා අත්පිට ගැණුම් පමණක් සටහන් කරයි
(3). ණයට හා මුදලට සිදුවන විකුණුම් හා ගැණුම් පමණක් සටහන් කරයි
(4). ව්‍යාපාරයේ ආදායම් හා වියදම් සටහන් කරයි

➢ පහත තොරතුරු උපයෝගී කර ගනිමින් 03 හා 04 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

ලිතුම්ගේ ව්‍යාපාරයේ 2019.12.31 න් අවසන් ගිණුම් වර්ෂයට අදාළ තොරතුරු පහත වේ.

| | රු. |
|---|---|
| ණයට විකුණුම් | 28 300 |
| අත්පිට විකුණුම් | 32 000 |
| ණයට ගැණුම් | 12 500 |
| අත්පිට ගැණුම් | 7 500 |

03. ලිතුම්ගේ ව්‍යාපාරයේ 2019.12.31 දිනට විකුණුම් ආදායම,

(1). රු. 28 300 (2). රු. 32 000 (3). රු. 20 000 (4). රු. 60 300

04. ලිතුම්ගේ ව්‍යාපාරයේ 2019.12.31 දිනට ගැණුම් වියදම,

(1). රු. 20 000 (2). රු. 7 500 (3). රු. 12 500 (4). රු. 5 000

05. විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය ගණනය කිරීමේදී සලකනු ලබන අයිතමයක් නොවන්නේ,

(1). ගැණුම්
(2). අවසාන තොගය
(3). ආරම්භක තොගය
(4). පැටවුම් කුලී

06. විකුණුම් පිරිවැය ගණනය කිරීම සඳහා භාවිතා කරන අයිතම පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,

(1). විකුණුම්, අවසාන තොගය (3). ගෙන ඒමේ කුලී, ගැණුම්

(2). ගැණුම්, වෙනත් ආදායම් (4). විදුලි වියදම්, ගැණුම්

07. දළ ලාභය හෝ අලාභය ගණනය කිරීම ශ්‍රිතයක් ආකාරයෙන් දැක් වූ විට පහත පරිදි වේ.

දළ ලාභය/දළ අලාභය = විකුණුම් ආදායම – A

ඉහත ශ්‍රිතයෙහි “A” අක්ෂරය පවතින ස්ථානය සඳහා යෙදිය යුතු අයිතමය වනුයේ,

(1). අවසන් තොගය (3). ගැණුම්

(2). ආරම්භක තොගය (4). විකුණුම් පිරිවැය

➢ පහත තොරතුරු උපයෝගී කර ගනිමින් අංක 08 සිට 10 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ක්‍රිෂ්ණගේ ව්‍යාපාරයේ 2019.12.31 දිනට පහත තොරතුරු ලබා දී ඇත.

| | රු. |
|---|---|
| 2019.01.01 දිනට තොගය | 12 000 |
| ගැණුම් - අත්පිට | 72 000 |
| - ණයට | 50 000 |
| විකුණුම් | 215 000 |
| පැටවුම් කුලී | 3 800 |
| ගෙන ඒමේ කුලී | 2 200 |

අතිරේක තොරතුරු

- 2019.12.31 දිනට ඉතිරි වූ තොගයේ පිරිවැය රු. 22 000

08. ක්‍රිෂ්ණගේ ව්‍යාපාරයේ 2019.12.31 දිනට විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය.

(1). රු. 118 000 (2). රු. 108 000 (3). රු. 140 000 (4). රු. 86 000

09. මෙම ව්‍යාපාරයේ 2019.12.31 දිනට විකුණුම් පිරිවැය,

(1). රු. 140 000 (2). රු. 90 000 (3). රු. 162 000 (4). රු. 118 000

10. මෙම ව්‍යාපාරයේ 2019.12.31 දිනට දළ ලාභය,

(1). රු. 97 000 (2). රු. 75 000 (3). රු. 125 000 (4). රු. 53 000

## II - කොටස

01. කමල්ගේ ව්‍යාපාරයේ ගිණුම් කාලච්ඡේදය 2019.12.31 න් අවසන් වන අතර පහත තොරතුරු ඔබ වෙත ලබා දී ඇත.

| | |
|---|---|
| අත්පිට විකුණුම් | රු. 70 000 |
| ණයට විකුණුම් | රු. 125 000 |
| ණයට ගැණුම් | රු. 55 000 |
| අත්පිට ගැණුම් | රු. 38 000 |
| පැටවුම් කුලී | රු. 5 000 |
| ගෙන ඒමේ කුලී | රු. 7 000 |
| 2019.01.01 ඉතිරි බඩු තොගය | රු. 10 000 |
| 2019.12.31 ඉතිරි බඩු තොගය | රු. 18 000 |

2019.12.31 න් අවසන් වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න.

(i). විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය.

(ii). විකුණුම් පිරිවැය

(iii). දළ ලාභය (ල.5×3)

02. රහල්ගේ ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය 2018.12.31 න් අවසන් වූ අතර පහත දත්ත ඔබ වෙත ලබා දේ.

| | රු. |
|---|---|
| පැටවුම් කුලී | 3 000 |
| ගෙන ඒමේ කුලී | 15 000 |
| විකුණුම් | 244 000 |
| ගැණුම් | 108 000 |
| 2018.01.01 ඉතිරි බඩු තොගය | 12 000 |

සටහන:- මිලදී ගත් භාණ්ඩ තොග සියල්ලම විකිණී ඇත.

(i). දළ ලාභය ගණනය කිරීම ප්‍රකාශනයක් මඟින් ඉදිරිපත් කරන්න. (ල.15)

*සැකසුම:- ඩී.එස්. චේතනා මිය*